# ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) - 2024

## මාර්ගෝපදේශ සංග්‍රහය - 02/2024











පළාත් පාලන මාර්ගෝපදේශ :- 02/2024 2024.01.01

# ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) - 2024

## ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහය

## 1. පරමාර්ථ

සීඝ්‍රයෙන් සිදුවන නාගරීකරණ ක්‍රියාවලියත් සමග වර්ධනය වන මහජන අවශ්‍යතා වලට සරිලන පරිදි බොහෝ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ පවත්නා පොදු පහසුකම් නිසි ලෙස නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම සිදු නොවන බව නිරීක්ෂණය වන කරුණකි.විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා යටතේ පවතින සතිපොළ, කැළිකසල කළමනාකරණය, කාණු පද්ධති, අතුරු පාරවල්, වාහන නැවතුම් ස්ථාන, ළමා උද්‍යාන, පොදු සනීපාරක්ෂක හා වැසිකිළි පහසුකම් වැනි අත්‍යාවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම්වල නඩත්තු හා අළුත්වැඩියා කටයුතු මෙහිදී ප්‍රධාන වේ. එබැවින්, ප්‍රාදේශීය සභාවල එම පහසුකම් නඩත්තු හා අළුත්වැඩියා කිරීම මගින් එම ආයතන වලින් ජනතාවට සැපයෙන සේවාවන් හි ගුණාත්මක භාවය හා ඵලදායීභාවය ඉහළ නැංවීම මූලික පරමාර්ථය කරගෙන “ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)” - 2024 ක්‍රියාත්මක කෙරේ.

ප්‍රාදේශීය සභා යටතේ පාලනය වන ඉහත කී යටිතල පහසුකම්වල නිසි පරිදි නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදු නොවීම නිසා ඒවා මහජනතාවට ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත්වූ අවස්ථා නිරීක්ෂණය වන අතර, ඒ හේතු කොටගෙන මහජනතාවට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් දැඩි ගැටළුකාරී තත්වයන් පවතින එවැනි යටිතල පහසුකම් මහජනතාවගේ ප්‍රයෝජනයට ගතහැකි වන ලෙස නඩත්තු කිරීමට හා අළුත්වැඩියා කිරීමට මෙම වැඩසටහන මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ.

## 2. ව්‍යාපෘති තෝරා ගැනීම

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා වෙත ලැබෙන පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ යෝජනා, අමාත්‍යාංශය වෙත පළාත් පාලන ආයතන මගින් සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ හා පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කරනු ලබන යෝජනා, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන මහජන ඉල්ලීම්ද සැලකිල්ලට ගනිමින් සුදුසු ව්‍යාපෘති ඒ ඒ පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ.

## 3 . වැඩසටහනට අදාළ ව්‍යාපෘති ක්ෂේත්‍ර

### *3.1 පොදු වැසිකිළි නඩත්තු / අළුත්වැඩියා කිරීම*

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බස් නැවතුම්පොළ, සතිපොළ, පුස්තකාල, ළමා උද්‍යාන, ළමා හා මාතෘ සායන, ආයුර්වේද මධ්‍යස්ථාන, ආගමික හා වෙනත් විශේෂිත ස්ථානවල ඉදිකර ඇති පොදු වැසිකිළි මනා ක්‍රියාකාරිත්වයකින් හා පිරිසිදු බවකින් යුක්තව පවත්වා ගැනීමට අවශ්‍ය නඩත්තු කටයුතු ඉටු කිරීම මේ යටතේ අදහස් කර ඇත.

මෙහිදී කිසියම් මුදලක් අයකර පෞද්ගලික අංශය විසින් හෝ ප්‍රාදේශීය සභා විසින් හෝ ක්‍රියාත්මක කරන ලබන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. පළාත් පාලන ආයතනය විසින් විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ නගර, ජනාකීර්ණ ස්ථාන හා මන්සන්ධි ආශ්‍රිතව ඉදිකර ඇති පොදු මහජන වැසිකිළි නිසියාකාරව නඩත්තු නොකරන බව පැහැදිළිව දක්නට ඇති කරුණකි.

දැනට මෙවැනි වැසිකිළිවල නඩත්තු කටයුතු ඉතා අවම මට්ටමින් පවත්වාගෙන යන බවත්, ඒ සඳහා විශේෂ අවධානයක් යොමු නොකරන බවත් පෙනී යයි. එබැවින්, එවැනි පොදු ස්ථානවල ඇති වැසිකිළි පිරිසිදුව පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභා මගින් සුදුසු වැඩ පිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කල යුතුය. එහිදී නඩත්තු කටයුතු පවත්වා ගැනීමට සුදුසු මුදලක් අය කරමින් නඩත්තු කරන පුද්ගලයන්ට ගෙවීමටත්, වැසිකිළි සඳහා වන ප්‍රවේශ මාර්ගය සහ වැසිකිළි අවට ඉතා පිරිසිදුව තබා ගැනීමටත් කටයුතු කළ යුතුය. ඒ යටතේ ජල පහසුකම් සැපයීම, වැසිකිළි පද්ධති වල ඇති අපද්‍රව්‍ය ගලි බවුසර් යොදා ඉවත් කිරීම, ක්‍රියා විරහිත උපාංගයන් නවීකරණය හෝ අලුතින් සවිකිරීම ආදිය සිදු කිරීමට යෝජනා කෙරේ.

පළාත් පාලන ආයතනය විසින් මාසිකව මුදල් උපයන වැසිකිළි සඳහා අනිවාර්යයෙන්ම පිරිමි සහ කාන්තාවන් සඳහා වෙන වෙනම වැසිකිළි පහසුකම්, ජල මුද්‍රිත වැසිකිළි, අත් සේදීම සඳහා බේසමක් (Sink), මුහුණ බලන කණ්නාඩියක්, විදුලිය, නඩත්තුකරුවෙක්, විධිමත් ප්‍රවේශ පහසුකම් (ආබාධිත පුද්ගලයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කල යුතුය.) සහ ජලය ගබඩා කිරීමේ ටැංකියක් වැනි පහසුකම් සැපයිය යුතුය.

හැකි සෑම ආකාරයකින්ම වැසිකිළි අවට පිරිසිදුව තබා ගැනීමත්, විශේෂයෙන්ම එළිමහනේ පවතින වැසැකිළි අවට මල් ආදිය සිටුවීමත් මගින් මහජනතාවට ප්‍රියජනක වන ආකාරයෙන් එම පරිසරය නඩත්තු කිරීම සඳහාත් අවධානය යොමු කිරීම වැදගත් වේ.

## *3.2 කාණු පද්ධති නඩත්තු කිරීම හා ඩෙංගු මර්ධනය*

මාර්ග දෙපස ඉදිකර තිබෙන කාණු පද්ධති වලට එකතු වන විවිධ අපද්‍රව්‍ය, රොන්මඩ මෙන්ම ජල වහනයකින් තොරව රැදී පවතින ජලය ඉවත් කිරීම ආදිය මෙමගින් සිදු කිරීමට අපේක්ෂිතය. මෙම කාණු පද්ධති නිසියාකාරව නඩත්තු නොකිරීම නිසා ජලය හොඳින් බැස නොයාම, ජලය මාර්ගයට ගලා යාම, කාණු ඉවුරු කැඩීයාම වැනි අවස්ථා දැකිය හැකි වේ. තවද, ඩෙංගු මදුරුවන් බෝවීම ඇතුලු රෝග කාරක වලට හේතූන් වන අවස්ථා ද තිබේ. එසේම මහජනතාව ද කාණු අපවිත්‍ර වන සේ නගරාශ්‍රිත කසල බැහැර කිරීමද දක්නට ලැබේ. එබැවින් කාණු පද්ධති පිරිසිදු කිරීම හා අලුත් වැඩියාවන් සඳහා මෙම ප්‍රතිපාදන උපයෝගී කර ගත හැකිය.

විශේෂයෙන්ම මහා මාර්ග දෙපස ඇති කාණු විධිමත් ලෙස නඩත්තු නොකිරීම හා එම කාණු ආවරණය කර ඇති කොන්ක්‍රීට් ආවරණ කැඩී බිඳී පදිකයන්ට අනතුරු දායක ලෙස පැවතීමත්, එවැනි කාණු පිරිසිදු නොකිරීම නිසා දුගඳ හැමීමත්, බොහෝ අවස්ථාවල දැකිය හැකිය. එබැවින් මෙම කාණු පද්ධති නිසියාකාරව පවිත්‍රකර තබා ගැනීම මගින් මහජනතාවට ඇතිවිය හැකි දුෂ්කරතාවයන් හා ආපදාවන් මෙන්ම පරිසර හානිය ද අවම කරනු ලබයි.

එසේම වෙළඳ සැල් ඉදිරිපස, පාසල්, ආරෝග්‍ය ශාලා, මහජන පුස්තකාල, සතිපොළ, හා මහජනයා ගැවසෙන අනෙකුත් පොදු ස්ථානවල මාර්ග දෙපස ඇති කාණු පද්ධති විධිමත්ව පවත්වාගෙන යාම අනිවාර්යය කරුණකි. විශේෂයෙන්ම පොදු කාණු පද්ධති සඳහා අනවසරයෙන් ජලබස්නා සකස් කර තිබීම නිසා විශාල වශයෙන් කාණු පදිධතිවල ජලය රැදීමත්, ඒ හේතුකොටගෙන ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම සිදුවන බව සෞඛ්‍ය බලධාරීන් විසින් අප වෙත වාර්තා කරනු ලැබ ඇත.එම නිසා මෙවැනි කාණු පද්ධති නොපමාව හඳුනාගෙන ඒවා නඩත්තු කිරීම සඳහා විශේෂ අවධානය යොමු වීම

අත්‍යාවශ්‍ය වේ. පළාත් පාලන ආයතනය විසින් නිතිපතා සිදුකරන ලබන කටයුතු වලදී අඛණ්ඩව නඩත්තු කටයුතු ක්‍රියාත්මක කළහැකි ක්‍රමවේදයකට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

## *3.3. වාහන නවතා තැබීමේ පහසුකම් සපයන ස්ථාන අළුත්වැඩියා කිරීම*

බොහෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල මංසන්ධි, බස් නැවතුම්පළ ඇතුළු නාගරික ප්‍රදේශවල පාපැදි,යතුරුපැදි,ත්‍රීරෝද රථ, සැහැල්ලු හා බර වාහන ආදිය නවතාලීම පිණිස විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකරන බව පෙනී යන කරුණකි. එබැවින් නොයෙකුත් මාර්ග අනතුරු, මෙන්ම රථවාහන තදබදය ඇතිවීමට මෙය බලපා ඇත. මේ සඳහා විසඳුමක් ලෙස වාහන නවතාලීම සඳහා නිශ්චිත ස්ථාන හඳුනාගෙන එම ස්ථාන විධිමත් ලෙස සකස් කිරීමට අදාළ ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය.මෙහිදී වාහන නවතාලීම සඳහා හඳුනා ගන්නා ස්ථානවල නාම පුවරු සවිකිරීම, බිම සළකුණු කිරීම, අවශ්‍ය ස්ථානයන්හි විදුලි ලාම්පු සවිකිරීම, සංඥා පුවරු සවිකිරීම ආදී කාර්යයන් සිදු කළ හැකිය.වාහන වලින් බදු මුදලක් ලබාගෙන නඩත්තු කරන වාහන අංගන සඳහා මෙහිදී ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

අදාළ රජයේ ආයතන, පෞද්ගලික අංශය සහ පොලීසිය සමග විශේෂ සාකච්ඡා පවත්වා සුදුසු තීරණවලට එළඹ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ යුතුය.

මෙවැනි ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රාදේශීය සභාවල වාර්ෂික ආදායම ද ඉහල නංවාගත හැකිය.

## *3.4 මහජන උද්‍යාන සහ ළමා උද්‍යාන නඩත්තු / අළුත්වැඩියා කිරීම*

මහජන උද්‍යාන සහ ළමා උද්‍යානවල අලංකරණ කටයුතු පවත්වා ගැනීම, තණකොළ කැපීම, විවිධ පැළ වර්ග සිටුවීම, හා ආරක්ෂිත වැට පිළිසකර කිරීම, ගොඩනැගිලි හා එහි ගෘහභාණ්ඩ අළුත් වැඩියා කටයුතු, ක්‍රීඩා සහ ව්‍යායාම කටයුතු සඳහා සවිකර ඇති විවිධ උපකරණවල (සෙල්ලම් මිදුල් ඇතුළුව) ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් ඒවා මනාව පවත්වා ගැනීමට අදාළවන ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය.ප්‍රතිසංස්කරණයෙන් පසු අඛණ්ඩ නඩත්තු හා මෙහෙයුම් ක්‍රමයක් යෝජනා කරන ව්‍යාපෘති සඳහා මෙහිදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

## *3.5 මාර්ග නාම පුවරු, සංඥා පුවරු හා බල ප්‍රදේශයේ සිතියම ප්‍රදර්ශනය කිරීම*

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ පවතින මාර්ග මහජනතාවට පහසුවෙන් හඳුනාගත හැකි පරිදි එම මාර්ගවල නම, දුර ප්‍රමාණය (කි.මී.) සඳහන් නාම හා සංඥා පුවරු සවි කිරීම මේ යටතේ සිදු කළ හැකිය. මෙම නාම පුවරු සුදු පැහැති පසුබිම මත කළු අකුරින් භාෂා තුනෙන් සඳහන් කර ප්‍රදර්ශනය කළ යුතුවන අතර නාම පුවරුවක් අවම වශයෙන් අඩි 2½ ක දිගකින් හා අඩි 1½ ක පළලින් සමන්විත විය යුතුය. (අවම වශයෙන් වසර 05 ක් වත් පවතින පරිදි සකස්කළ යුතුය.)

එමෙන්ම පොදු පහසුකම් මධ්‍යස්ථානවල පිහිටීම පිළිබඳව මහජනයාට පහසුවෙන් අවබෝධයක් ලැබෙන පරිදි ඒවා පිහිටි දිශාව සහ දුර ප්‍රමාණය (මී/කි.මී.)සඳහන් පුවරු මංසන්ධිවල ප්‍රදර්ශනය කළ යුතුය. (ප්‍රාදේශීය සභා කාර්යාලය ද ඇතුලත්ව) මෙන්ම ප්‍රධාන මාර්ගවල මංසන්ධි ස්ථානවල මාර්ග සංඥා පුවරු සවි කිරීම සඳහා ද කටයුතු කළ හැකිය.

## 3.6 සතිපොල නඩත්තු කිරීම

සතිපොල තුල එකතු වන කැලි කසල ඉවත් කිරීම, එය පවත්වාගෙන යන භූමියෙහි ජලවහනය විධිමත්ව පවත්වා ගැනීම, සතිපොල භූමියේ ඇති ගොඩනැගිලිවල අබලන් වූ බිත්ති, ගෙබිම වහලය ආදිය අලුත්වැඩියා කිරීම වැනි අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරමින් ඒවා තිරසාර ලෙස පවත්වා ගැනීම, සතිපොල භූමිය තුල පානීය ජල පහසුකම් සහ වැසිකිළි පහසුකම් සලසාදීම ආදී නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ක්‍රමවත්ව සිදු කිරීම මේ යටතේ අදහස් කෙරේ.මෙහිදී සතිපොළ නොපවත්වන දිනවල සමෘද්ධි හා ස්වයං රැකියාලාභීන් සඳහා මෙම ස්ථානය විවෘතකර හැකිවන පරිදි වැඩපිළිවෙළක් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට හැකිය.

මීට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමේදී සතිපොළේ වෙළදාම් කරන වෙළඳුන් සංඛ්‍යාව, වෙළඳ පිරිවැටුම යනාදිය ඉදිරිපත් කරමින් යෝජනා ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

## 3.7 යන්ත්‍රෝපකරණ, වාහන හා ඒවා නවතා තැබීමේ පහසුකම් (Garage) නඩත්තු / අළුත්වැඩියා කිරීම

ඇතැම් ප්‍රාදේශීය සභා සතු ට්‍රැක්ටර්, ගලිබවුසර්, ජල බවුසර්, ටිපර්, බරවාහන ඇතුළු යන්ත්‍රෝපකරණ හා වාහනවල අත්‍යාවශ්‍ය සුළු අලුත්වැඩියාවන් සිදු නොකිරීම නිසා ඒවා ප්‍රයෝජනයට නොගෙන තබා ගෙන ඇති අවස්ථා නිරීක්ෂණය වේ. මේ නිසා ප්‍රාදේශීය සභා සතු යන්ත්‍රෝපකරණ හා වාහන තිරසාර ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මූලික නඩත්තු කටයුතු සිදු කිරීම මේ යටතේ අදහස් කෙරේ.
මේ යටතේ සභාව සතු කැබ් රථ අළුත්වැඩියා කිරීම සිදු කළ නොහැකිය.

එසේම ප්‍රදේශීය සභාව සතු ඉහත සඳහන් වාහන ආරක්ෂිතව ගාල් කිරීම සඳහා පවතින ගරාජයන්හි අළුත්වැඩියා කටයුතු සිදු කිරීම ද කළ හැකිය.

## 3.8 ප්‍රජා ජල ව්‍යාපෘති නඩත්තු කිරීම

පානීය ජල අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක බොහෝ ජල ව්‍යාපෘති නිසි නඩත්තු ක්‍රමවේදයක් නොමැති නිසා අතරමග නවතා දැමීම දක්නට හැකිය. මෙවැනි ව්‍යාපෘතීන්හි ඉදිකිරීම්වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය. විශේෂයෙන් සභාව මගින් පාලනය වන පානීය ජල යෝජනා ක්‍රම වල ජලනල කැඩීයාම, ජල ටැංකි හා කරාම වලින් ජලය කාන්දු වී අපතේ යාම දක්නට ලැබේ. ඒවා අලුත්වැඩියාව හා නඩත්තුව ද ජල ටැංකි පිරිසිදු කිරීම ද මෙමගින් ඉටුකල හැකිය. තවද, ජලය ලබාගන්නා ජල මූලාශ්‍ර හා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම හා එවැනි තැන්වල ගස් සිටුවා සංරක්ෂිත භූමි වශයෙන් ආරක්ෂා කිරීම ආදී කටයුතු ද මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය.

## 3.9 ප්‍රාදේශීය සභා සතු ස්ථාවර වෙළද මධ්‍යස්ථාන නඩත්තු/ අළුත්වැඩියා කිරීම

ප්‍රාදේශීය සභා විසින් මේ වන විට ඉදිකර ඇති ස්ථාවර වෙළද මධ්‍යස්ථාන වල පහසුකම් වැඩිදියුණු කරමින් ජනතාවට වඩාත් ආකර්ශනීය ලෙස එම ගොඩනැගිලි පවත්වා ගෙන යාම අදහස් කෙරේ. විශේෂයෙන් මෙම වෙළඳ මධ්‍යස්ථාන වල කසල බඳුන් ස්ථාපිත කිරීම, ජල පහසුකම් ලබා දීම, විදුලිය ලබා දීම, අදාල ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම, ආබාධිත පුද්ගලයින්ට ප්‍රවේශවීමේ පහසුකම් සැකසීම, පාරිභෝගිකයින්ගේ වාහන නැවැත්වීමට පහසුකම් සළසා දීම, විවේක ගැනීමට ආසන තැනීම වැනි දෑ ක්‍රියාත්මක කල හැකිය.

### *3.10 ආයුර්වේද මධ්‍යස්ථාන සහ ළමා හා මාතෘ සායන විධිමත්ව පවත්වා ගැනීම*

ප්‍රාදේශිය සභාව මඟින් පාලනය වන ආයුර්වේද මධ්‍යස්ථාන සහ ළමා හා මාතෘ සායන වල ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු, විදුලිය පහසුකම් පවත්වා ගැනීම, උපකරණ අලුත්වැඩියා කිරීම, ප්‍රවේශ පහසුකම් සළසා දීම ආදී කටයුතු ඉටුකිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

# 4 ක්‍රියාත්මක කල යුතු ක්‍රමවේදය

මෙම වැඩසටහන යටතේ එක් ප්‍රාදේශීය සභාවකට 2024 සඳහා රු. 1,500,000.00 ක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබා දිය හැකි අතර එම ප්‍රතිපාදන නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සඳහා පමණක් ලබා දෙන බව අවධාරණය කෙරේ.

ව්‍යාපෘති යෝජනා හා ඇස්තමේන්තු අදාළ නිර්දේශයන් සමග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ පසු සහ ඊට අදාළ අනුමැතිය ලැබීමෙන් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන දැනුවත් කරන අතර ප්‍රාදේශීය සභා විසින් ඊට අදාළව ඉදිරිපත් කරනු බිල්පත් සඳහා මුදල් නිදහස් කරනු ලැබේ.

එම බිල්පත් ඉදිරිපත් කිරීමේදී පළාත් පාලන ඉංජිනේරුගේ, පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ හා පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාවලට ලබා දෙන ප්‍රතිපාදන, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්ෂේත්‍රයනට අදාළ වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් යෙදවීම අනිවාර්යය වේ.

## *4.1 ඇස්තමේන්තු සැකසීම*

1. ඇස්තමේන්තු සැකසීමේදී පදනම් කරගත යුත්තේ දිස්ත්‍රික් මිල කමිටුවේ හෝ පළාත් සභාවේ අනුමත මිල ගණන් වේ.
2. ව්‍යාපෘති සඳහා වැයවන මුදලින් කොටසක් අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින්ද ඉතිරිය පළාත් පාලන ආයතන මගින්ද දැරිය හැකි ලෙස ද ඉදිරිපත් වන යෝජනා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

## *4.2 ව්‍යාපෘති අනුමත කිරීම*

සියළුම ව්‍යාපෘති සඳහා සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. සභාව විසුරුවා ඇති අවස්ථාවක් නම් ව්‍යාපෘති කළමනාකරණ කමිටුව මගින් ඒ සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් අනුගමනය කර ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් වේ. එසේ අනුමැතිය ලබාගත් ව්‍යාපෘති **RC ආකෘතිය (ඇමුණුම 01)** හි පරිදි සකස් කොට සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය හා පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය සහිතව අනුමැතිය සඳහා මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

අනුමත ව්‍යාපෘති නාමයන් හා ව්‍යාපෘති ඇස්තමේන්තු සංශෝධනය කරන්නේ නම් ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

හදිසි හා අත්‍යවශ්‍ය අවශ්‍යතා මත මෙම මාර්ගෝපදේශයට පරිබාහිරව ව්‍යාපෘති අනුමත කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම් සතුය.

## 5. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විශේෂ කරුණු

5.1. සියලුම ඉදිකිරීම්, සංවර්ධන කටයුතු හා මිලදී ගැනීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, චක්‍රලේඛ හා උපදෙස්වලට අනුකූලව කටයුතු කළයුතු වේ.

5.2. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) යටතේ ඉදිරිපත් කර ඇති මාර්ගෝපදේශයෙහි සඳහන්වන වැඩසටහන් කිසිවක් මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ නොහැකිය.

5.3. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමට යෝජනා කරන අතර, ජනතා සහභාගිත්වය ලබා ගැනීම තුලින් සංවර්ධන ව්‍යාපෘතිවල නව ඉදිකිරීම් කටයුතු සඳහා වැය වන පිරිවැය අවම කරගැනීමටත්, මහජන අවශ්‍යතා කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමටත් මෙම කාර්යයන්හි තිරසාර බව පවත්වා ගැනීමටත් හැකි වේ.

5.4. මෙහි සඳහන් ක්ෂේත්‍ර යටතේ පමණක් ව්‍යාපෘති හඳුනාගත යුතු අතර සභාව වෙත වෙන් කෙරෙන මුදල් සීමාව ඉක්මවා ව්‍යාපෘති ක්‍රියාත්මක නොකළ යුතුය.

5.5. ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියේ තොරතුරු සඳහන් පුවරුවක් ඉදිකිරීම සඳහා ඊට අදාළ පිරිවැය ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතුය. මේ සඳහා වෙන් කළ හැකි උපරිම මුදල රු. 10,000 කි. (ආකෘතිය මේ සමග අමුණා ඇත - **ඇමුණුම 02**)

## 6. මාසික ප්‍රගතිය

සෑම මසකටම අදාළ ප්‍රගතිය මීට යාකොට ඇති **ඇමුණුම 03** පරිදි ඊළඟ මාසයේ 5 වෙනි දිනට ප්‍රථම පළාත් පාලන කොමසාරිස් මගින් මෙම අමාත්‍යාංශයට එවීම අනිවාර්යය වේ.